**සී/ස ලංකා රාජ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීමේ (පෞද්ගලික) සමාගම - 2017**

-----------------------------------------------------------------------------------------------------------------------------

සී/ස ලංකා රාජ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීමේ (පෞද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2016 සහ 2017 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

--------------------------------------------------------------------

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් සමාගමේ 2016 සහ 2017 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වත්කම් හා වගකීම්

----------------------

සමාගම විසින් පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 41,093,545 |
| ජංගම වත්කම් | 255,641,188 |
| මුළු වත්කම් | 296,734,733 |
| **බැරකම්** | |
| ජංගම බැරකම් | 268,221,354 |
| ජංගම නොවන බැරකම් | 1,312,690 |
| මුළු බැරකම් | 269,534,044 |

| | |
|---|---|
| හිමිකම් | 27,200,689 |
| මුළු හිමිකම් සහ බැරකම් | 296,734,733 |
| | |
| මුළු ආදායම | 197,244,002 |
| මුළු වියදම | 197,207,314 |
| | |
| වර්ෂයේ අතිරික්තය | 36,688 |

2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් පිළිබඳ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය

| | නීති, රීති, සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 23 වගන්තිය | 2011 ජූලි 18 දින සමාගම පිහිටුවීමෙන් පසුව සමාගමේ වාර්ෂික මහාසභා රැස්වීම පවත්වා නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 සහ 4 පරිච්ඡේද සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 26 වගන්තිය | 2014 පෙබරවාරි 20 දිනෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණ අතර සමාගම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණි. මව් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම තීරණවලට එළඹ තිබූ බව නිරීක්ෂණය විය. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | 2016 සහ 2017 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. එම නිසා වත්කම්හි පැවැත්ම පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. |

03. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කාර්යසාධනය

---

3.1.1 සැලසුම් කිරීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව 2016 සහ 2017 වර්ෂ සඳහා සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 මෙහෙයුම් සහ සමාලෝචනය

-----------------------------------

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, ලංකා රාජ්‍ය ජාලය සහ ලංකා ද්වාර මෙහෙයුම් කළමනාකරණය සහ නඩත්තු කිරීම සඳහා වගකීම සමාගමේ ප්‍රධාන අරමුණු විය. කෙසේ වෙතත්, සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඇතුළුව ලංකා රාජ්‍ය ජාලයට සහ ලංකා ද්වාර මෙහෙයුම්වලට අදාල සියළුම ව්‍යාපෘති කළමනාකරණ ක්‍රියාකාරකම් මව් සමාගම (ශ්‍රී ලංකා තොරුතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය) විසින් මෙහෙයවනු ලබන බව නිරීක්ෂණය වූ අතර සමාගම ව්‍යාපෘති මෙහෙයුම් සහ නඩත්තු කිරීම සඳහා සීමා වී තිබුණි. එම නිසා සමාගම විසින් එහි අරමුණුවලට අදාල ක්‍රියාකාරකම් සිදුකිරීම අතින් අසාර්ථක වී තිබුණ බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉ. ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුදල් සපයන්නා වශයෙන් ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය වෙත එවැනි ස්වාධීනත්වයක අවශ්‍යතාවය සඳහන් කිරීම නිසා 2003 ජූලි 16 දිනැති අංක සීඑම්පී/03/0884/134/027 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හරහා මූල්‍ය හා පරිපාලන අංශයන් සඳහා සම්පූර්ණ ස්වාධීනත්වය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (තො.ස.තා.නි) වෙත හිමි වී තිබුණි. කෙසේ වෙතත් තො.ස.තා.නි හි පරිපාලතයක් වශයෙන් වර්තමානයේදී සමාගම සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ අරමුදල් මත යැපෙන අතර අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පෙර පැවැති මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය තවදුරටත් අඛණ්ඩව පවතින බව නිරීක්ෂණය විය. එසේම මූල්‍ය හා පරිපාලන අංශයන් සඳහා වන සම්පූර්ණ ස්වාධීනත්වය ලබා දී තිබුණේ ලෝක බැංකු ආධාර ලබාදීම නිසා නොව කෙටි කාලයක් තුළදී ප්‍රතිඵල ලබාදීම සඳහා වඩා සුදුසුකම් සහිත විශේෂිත පුද්ගලයින් බඳවා ගැනීම සඳහා බව සමාගම විසින් සඳහන් කර තිබුණි.

(ආ) ව්‍යාපෘති සැලසුම් කිරීම, ගිණුම් පිළියෙල කිරීම, පරිපාලනය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළුව සමාගමේ සියළුම කාර්යයන් මව් සමාගම විසින් මෙහෙයවනු ලබන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි සමාගම පිහිටුවා තිබෙන අතර වාර්ෂික කුලිය ලෙස රු. මිලියන 4.7 ක මුදලක් ගෙවා තිබුණි. ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතියෙහි මෙහෙයුම් නිලධාරීන් පමණක් සමාගම් පරිශ්‍රයෙහි අනුයුක්තව සිටියද ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතියෙහි වැඩසටහන් සහ ව්‍යාපෘති කළමනාකරුවන් ද මව් සමාගමට අනුයුක්ත කර තිබුණි. එම නිසා, ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය සඳහා වෙන්වූ සමාගමක් පිහිටුවීම සඳහා වන හේතුව විගණනයේදී ගැටළු සහගත විය.

3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 වගන්තිය අනුව මානව සම්පත් අයවැය හා ඒකාබද්ධව මානව සම්පත් සැලසුම පිළියෙල කළ යුතු අතර එය භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමෙන්තුවේ ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත් එවැනි සැලසුමක් ලංකා රාජ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් (පෞද්ගලික) සමාගම (ලං.රා.තො.ය) විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය අනුව එක් එක් තනතුරු සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් ලං.රා.තො.ය විසින් සකස් කර නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.6 වගන්තිය අනුව සමාගම විසින් කාර්යසාධන ඇගයීම් ඒකාකාරීව සිදුකර නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තියෙහි සඳහන්වන පරිදි භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව සමාගම විසින් උපදේශකයන් සඳහා වැටුප් සහ දීමනා ගෙවා තිබුණි. එසේම අනුමත කාර්ය මණ්ඩලයක් සහ බඳවා ගැනීමේ පටිපාටියක් නොමැතිව කොන්ත්‍රාත් පදනම මත සියළුම සේවකයින් සහ උපදේශකයින් පත්කර තිබුණ බව නිරීක්ෂණය විය.

(ඉ) වැටුප් ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමකින් තොරව, ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන, උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

04. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

4.1 විගණන කමිටු
-----------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 සහ 7.4.2 වගන්තිවලට අනුව සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

05. පද්ධති හා පාලනයන්
-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන්ගේ දුර්වලතා වරින් වර සමාගමේ සභාපතිගේ සැලකිල්ලට ගෙනඑනු ලැබීය. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂිත අවධානක් යොමු විය යුතුව පවතී.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | සමාගමේ පරමාර්ථ ළගාකරගැනීමට කාර්යක්ෂමව දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කිරීම, ලේඛනගත කිරීම, අයිතිය හුවමාරු කිරීම සහ ආරක්ෂා කිරීම සහ සම්පත් උපයෝජනය සිදු නොකිරීම. |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | සමාගමේ අරමුණු ළගාකර ගැනීමට නීති රෙගුලාසිවලට අනුව මානව සම්පත් කළමනාකරණය සිදු නොකිරීම. |